# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 9 දරන
# ජනාවාස (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 මාර්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 මාර්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 9 දරන ජනාවාස (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 මාර්තු මස 21 වන දින]

එල්. ඩි.—ඕ. 6/80.

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 25 දරන ජනාවාස පනත ඉවත් කිරීම පිණිස ද ; ජනාවාස කොමිෂන් සභාවේ ඇවරකරුවන්ගේ ක්‍රියා බලාත්මක කිරීම පිණිස ද ; ලියාපදිංචි කරන ලද ජනාවාස සම්බන්ධයෙන් ඇවරකරුවන් පත් කිරීම පිණිස ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1984 අංක 9 දරන ජනවාස (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රහුබු නාමය.

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 25 දරන ජනාවාස පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 25 දරන පනත ඉවත් කිරීම.

**3.** 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වන වගන්තිය යටතේ 1981 නොවැම්බර් 16 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය අනුව පත් කරනු ලැබූ ඇවරකරුවන් විසින් අදාළ කාලසීමාව තුළ දී ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ඉටුකරනු ලැබූ යම් බලතලයක් හෝ කාර්යයක් නීත්‍යනුකූල ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ඉටුකරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි ඇවරකරුවන් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් අනුව පත් කරනු නොලැබීමේ හේතුව මත පමණක් හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් අනුව ජනාවාස කොමිෂන් සභාව විසුරුවා හරිනු නොලැබීමේ හේතුව මත පමණක් හෝ අදාළ කාල සීමාව තුළ දී එවැනි ක්‍රියාත්මක කිරීමක් හෝ ඉටුකරනු ලැබීමක් නිර්බල නොවිය යුතු ය.

ඇවරකරුවන් පත් කිරීමේ දෝෂ නිසා ඔවුන් නිසි ලෙස පත් කරනු ලැබීමට පෙර ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ඉටු කරනු ලැබූ බලතල හා කාර්ය නිර්බල නොවිය යුතු බව.

මේ වගන්තියේ කාර්ය සඳහා "අදාළ කාලසීමාව" යන්නෙන් 1980 අගෝස්තු මස 18 වන දින සිට 1982 අගෝස්තු මස 19 වන දින දක්වා වූ කාලසීමාව අදහස් වේ.

**4.** ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 25 දරන ජනාවාස පනත ඉවත් කිරීම නොතකා—

ජනාවාස සම්බන්ධයෙන් ඇවරකරුවන් පත් කිරීම.

(1) ජනාවාස කොමිෂන් සභාව සම්බන්ධයෙන් පත් කරනු ලැබූ ඇවරකරුවන් එකී ජනාවාස පනත යටතේ පිහිටුවනු ලැබූ එක් එක් ජනාවාසය සඳහා පත් කරනු ලැබූ ඇවරකරුවන් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට ඉහතින් ම වූ දිනයෙහි පැවතියා වූ එවැනි සෑම ජනාවාසයකම වත්කම් හා බැරකම් පිළිබඳව, ඇවරකරුවකුට 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඇවරකරුවකු ලෙස සමාන බලතල තිබිය යුතු ය.

2—ඒ 074661—6,225 (84/01)

වැඩිපුර ඇති මුදල් භාණ්ඩාගාරයට පැවරීම.

5. පිළිවෙළින් ජනාවාස කොමිෂන් සභාව හෝ ජනාවාස සම්බන්ධයෙන් පත් කරනු ලැබූ ඈවරකරුවන් විසින් අවස්ථාවෝචිත පරිදි ජනාවාස කොමිෂන් සභාවේ හෝ ජනාවාසවල අරමුදල්, 1971 අංක 38 දරන මුදල් පනතේ 21 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා යෙදවීමෙන් පසු ඉතිරි වන යම් මුදලක් වේ නම් ඒ මුදල භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.